උඩුදුම්බර ප්‍රාදේශීය සභාව
මහනුවර දිස්ත්‍රික්කය
------------------------

1. මූල්‍ය ප්‍රකාශන
------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 28 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින ද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
---------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට උඩුදුම්බර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
-----------------------------------------------

(අ) ගිණුම්කරණ අඩුපාඩු
------------------------

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ජල යෝජනා ක්‍රම 02 ක වටිනාකම රු.2,512,045 ක් ප්‍රග්ධනිත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | පිළිගතිමි. 2019 වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේදී නිවැරදි කරමි. |
| (ii) | ප්‍රාදේශීය සභාව සතු වූ ඉඩම්වල වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | පිළිගතිමි. 2019 වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේදී නිවැරදි කරමි. |
| (iii) | පරිත්‍යාගයක් ලෙස ලැබී තිබුණු ජල බවුසරයේ වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | ජල බවුසරයේ වටිනාකම ගිණුම්ගත කළ යුතුවේ. | පිළිගතිමි. 2019 වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේදී නිවැරදි කරමි. |
| (iv) | රු.257,600 ක් වටිනා කාර්යාල උපකරණ අයිතම 7 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | වත්කම් ප්‍රාග්ධනිත කළ යුතුවේ. | පිළිගතිමි. 2019 වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේදී නිවැරදි කරමි. |
| (v) | භාණ්ඩ වෙන්දේසියෙන් ලැබූ රු.53,002 ක ආදායම ගිණුම්ගත කර නොතිබුණි. | ආදායම ගිණුම්ගත කළ යුතුවේ. | පිළිගතිමි. 2019 වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේදී නිවැරදි කරමි. |

(ආ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණ | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | වර්ෂ 5 කට වැඩි කාලයක් ඉක්මවූ ලැබිය යුතු ශේෂ රු.465,684 ක් විය. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ණයගැති ශේෂ පිළිබඳව පිළිතුරක් 2019 මැයි 31 දිනට පෙර ලබා දෙමි. |
| (ii) | වසර 5 ක් ඉක්මවූ ණයහිමි ගිණුම් ශේෂවල එකතුව රු.1,624,827 ක් විය. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | ණයහිමි ශේෂ පිළිබඳව පිළිතුරක් 2019 මැයි 31 දිනට පෙර ලබා දෙමි. |

(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු.134,897,875 ක් වටිනා ඉඩම්වලට අදාළ හිමිකම් ඔප්පු විගණනයට ඉදිරිපත් නොකෙරිණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම්ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | සභාව සතුව ඇත්තේ ඔප්පු 15 කි. |

1. 4 අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 371(2)(ආ) | රු.166,784 ක් වූ අත්තිකාරම් ශේෂ පියවාගෙන නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | පාඨමාලා 2 කට ලබාදුන් අත්තිකාරම් සහතික පත්‍ර ඉදිරිපත් කළ පසු පියවීමට කටයුතු කරමි. |
| (ආ) | 2013 ජූලි 31 දිනැති අංක 07 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය හා ත්‍රී රෝද රථ නියාමනය පිළිබඳ උපදෙස් දී ඇති අමාත්‍ය මණ්ඩල සංදේශය | ත්‍රීරෝද රථ සේවාව විධිමත් කිරීමට කටයුතු කර නොතිබුණි. | ත්‍රීරෝද රථ නියාමනය කර ගාස්තු අය කළ යුතුවේ. | ත්‍රීරෝද රථ ලියාපදිංචි කර අවසරපත්‍ර නිකුත් කර විධිමත් කිරීමට කටයුතු කර ඇත. |

## 1.5 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාපතිවරයාට සහ උප සභාපතිවරයාට රු.65,000 ක් වැයකර ජංගම දුරකථන 2 ක් ලබාදී තිබුණි. | නීති රීති අනුව කටයුතු කළ යුතු වේ. | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතට 1993 සිදුකළ සංශෝධනයට අනුව මෙම පහසුකම් ලබා දී ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.2,864,707 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,783,732 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 1,322,000 | 650,604 | 1,518,749 | 466,760 | 1,196,000 | 1,277,747 | 1,023,324 | 254,423 |
| (ii) | කුලී | 2,115,000 | 2,981,952 | 1,963,040 | 125,000 | 1,830,000 | 1,979,240 | 1,746,560 | 232,680 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 890,000 | 1,149,950 | 1,166,200 | 411,900 | 1,290,000 | 1,131,590 | 833,140 | 298,450 |
| (iv) | වෙනත් ආදායම් | 36,582,279 | 2,013,807 | 2,286,897 | 141,030 | 4,979,000 | 8,964,052 | 7,124,889 | 1,839,163 |
| | | 40,909,279 | 6,796,313 | 6,934,886 | 1,144,690 | 9,295,000 | 13,352,629 | 10,727,913 | 2,624,716 |

#### 2.2.2 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ රැස්කළ යුතු සමස්ථ ආදායම රු.9,421,029 ක් වුවද, වර්ෂය තුළ රැස් කරන ලද ආදායම රු.6,934,886 ක් වීමෙන් ආදායම් රැස්කිරීමේ ප්‍රගතිය සියයට 74 ක් විය. | හිඟ ආදායම් අයකර ගත යුතුවේ. | පිළිගනිමි. |

2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.543,717 ක් හා මුද්දර ගාස්තු රු.4,129,644 ක් විය. | අදාළ මුදල් සභාව වෙත ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි. |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් කාරණා 2 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා ආදායම් උපයා ගැනීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි. |

(ආ) අපේක්ෂිත ප්‍රතිලාභ (out come) ලබා නොගැනීම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | පුරනැගුම ව්‍යාපෘතියෙන් රු.42,160,398 ක් වැයකර ඉදිකළ හුන්නස්ගිරිය බහුකාර්යය ගොඩනැගිල්ල වර්ග අඩි 4870 ක් නිෂ්කාර්යව පැවතුණි. | වත්කම්වලින් අපේක්ෂිත ප්‍රතිලාභ ලබාගැනීමට කටයුතු කළ යුතුවේ. | ආදායම් උත්පාදනය සඳහා කටයුතු කළද එය අසාර්ථක විය. නැවත ටෙන්ඩර්කර ලබාදීමට තීරණය කර ඇත. |
| (ii) | තිස්ස අත්තනායක සම්මන්ත්‍රණ ශාලාව රු.4,758,528 කට අලුත්වැඩියා කර තිබුණද 2018 වර්ෂයේදී උපයා තිබුණේ රු.5,000 ක් පමණි. | වත්කම්වලින් අපේක්ෂිත ප්‍රතිලාභ ලබාගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී ගාස්තු අය කිරීම් ගැසට් මඟින් ප්‍රසිද්ධ කිරීමට කටයුතු කරමි. |

(ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

-----------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| කොවුලේගම කොම්පෝස්ට් අංගනයක් ස්ථාපිත කර කොම්පෝස්ට් අගල හා ගබඩාව සඳහා 2010 වර්ෂයේදී රු.3,487,828 ක මුදලක්ද, යන්ත්‍ර සූත්‍ර මිලදී ගැනීමට 2012 – 2017 වර්ෂවලදී රු.5,069,140 ක මුදලක් වැයකර තිබුණද ව්‍යාපෘතිය අසාර්ථක තත්ත්වයේ පැවතුණි. | විධිමත්ව දිරන නොදිරන සහ අපද්‍රව්‍ය කළමනාකරණයට කටයුතු කළ යුතු වේ. | පිළිගනිමි. |

(ඈ) තිරසර සංවර්ධන ඉලක්ක

-------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව විසින් තිරසර සංවර්ධන අරමුණු ඉලක්ක හඳුනාගෙන ඒවා ළඟා කර ගැනීමට හා ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශකයන් හඳුනාගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන ඉලක්ක හඳුනාගෙන ඒවා ළඟාකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | 2020 ක්‍රියාත්මක සැලැස්ම සකස් කිරීමේදී දර්ශක හඳුනා ගැනීමට කටයුතු කරමි. |

3.2 මානව සම්පත් කළමනාකරණය

-------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සේවක පුරප්පාඩු 29 ක් විය. | සේවක පුරප්පාඩු පුරවා ගැනීමට කටයුතු කළ යුතුවේ. | සභා පත්වීම් ලබාදීමට කටයුතු කළ හැක. |

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව සතු ජල ව්‍යාපෘති 3 ක ජල පාරිභෝකයින් 304 දෙනෙකුට ජල මනු සවි නොකර වාණිජ්‍ය ආයතන වලින් රු.200 ක් ද ගෘහස්ථ පාරිභෝගිකයින්ගෙන් රු.150 ක ස්ථාවර ගාස්තුවක් අයකර තිබුණි. | ජල මනු සවි කිරීමට කටයුතු කළ යුතුවේ. | ජල මනු සවි කළද පෙරහන් ක්‍රමයක් භාවිතා නොකිරීම හේතුවෙන් ජල මනු අක්‍රීය වී ඇත. |

3.4 වත්කම් කළමනාකරණය

3.4.1 වත්කම්වලින් ලැබිය යුතු ආදායම් ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| රු.21,943,890 ක් වටිනාකම වූ වාහන හා යන්ත්‍රෝපකරණ 3 ක් උපයෝජනය කර නොතිබුණි. | මෙම යන්ත්‍රෝපකරණ ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුවේ. | රියදුරන් නොමැතිකම හා ඉල්ලුමක් නොමැති වීම නිසාය. |

3.4.2 නිෂ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වාහන 4 ක් නිෂ්කාර්යව සභා පරිශ්‍රයේ ගාල්කර තිබුණි. | ප්‍රයෝජනයට ගත නොහැකි වත්කම් අපහරණය කළ යුතුවේ. | නිෂ්ක්‍රීය වත්කම් වෙන්දේසි කරමි. |